# ආදි බුදුදහමේ විඤ්ඤාණ සංකල්පය හා යෝගාචාර විඥප්තිමාත්‍රතාව අතර තුලනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය කරපික්කඩ සෝභිත[1]

ආදි බුදුසමය පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමේ දී බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ධර්මය පර්යාය වශයෙන් දේශනා කොට ඇති ආකාරය දක්නට ඇත. ''විඤ්ඤාණය'' පිළිබඳ මුල් බුදු සමයාගත ඉගැන්වීම් ද මෙම පර්යාය ලක්ෂණය මත සිදු වේ. ''විඤ්ඤාණය'' යන්නට පර්යායව පද දෙකක් මුල් බුදුසමය තුළ හමු වේ. එනම්, **''චිත්ත, මනො''** යන්න යි. මෙහි දී සත්ත්වයාගේ ඒකායන අභිප්‍රාය වන විමුක්ති සාධනය උදෙසා විඥානයේ ක්‍රියාකාරීත්වයට මුල් බුදුසමයේ දී හිමිවන්නේ ප්‍රමුඛ අවස්ථාවකි. විමුක්තිය හෝ සාංසාරිකත්වය විඥානයේ ක්‍රියාකාරීත්වය මත රඳා පවතින බව මුල් බුදුසමයේ බොහෝ සූත්‍ර දේශනාවල දැක්වේ. එය පිරිසිදු භාවයට පත් කල්හි ආශ්‍රවක්ෂය ඥානය වෙත පුද්ගලයා යොමු කිරීමෙන් සියලු ආශ්‍රවයන්ගෙන් මිදී විමුක්තිය ලබා ගත හැකිබව බෞද්ධ ආකල්පයයි. බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව ධර්මය සහ විනය පිළිබඳව ඇති වූ නොයෙක් මතවාද පදනම් කොටගෙන පසුකාලීනව සංඝ සමාජය හීනයාන, මහායාන, තන්ත්‍රයාන ආදී වූ නිකායයන්ට බෙදී ගිය අතර, මෙයින් ධර්මය විවිධාකාරයෙන් විග්‍රහ කිරීමටත්, විස්තර අටුවා සැපයීමටත් පසුකාලීන බෞද්ධ ආචාර්යවරු යොමු වූහ. මෙහි දී මහායානික ආචාර්යවරු උක්ත කාර්යය විෂයෙහි සුවිශේෂී දායකත්වයක් සපයා ඇත. මුල් බුදුසමයේ ආභාසය ලැබූ ඔවුහු එහි සාරය ගෙන, මූලික ධර්ම කරුණු නොයෙකුත් අයුරින් අර්ථ දැක්වූහ. එයින් නිර්මාණය වූ බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායයන් අතර යෝගාචාර විඥානවාදී දර්ශනය ප්‍රමුඛ වූවකි. මෙම යෝගාචාර සම්ප්‍රදායේ මූලික ඉගැන්වීම වනුයේ විඥප්තිමාත්‍රතාවයි. එනම් ලෝකය තුළ දක්නට ලැබෙන සියලු ධර්ම යථාර්ථවාදීව **සිතිවිලි මාත්‍රයක් පමණක්** බව දැක්වීමයි. මෙම ඉගැන්වීම සඳහා ඔවුන් මූල බීජ සපයනු ලබන්නේ මූලික සූත්‍රාගත දේශනාවන් තුළ ඇති විඤ්ඤාණ පිළිබඳ අදහස තුළිනි. ම.නි. මධුපිණ්ඩික සූත්‍රය තුළ පුද්ගලයා ඉන්ද්‍රිය සන්නිකර්ෂණය ලබා ගැනීම පිළිබඳ පුළුල් වූ විග්‍රහයක් දක්නට ඇත. එම දේශනාව අනුව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියේ අවසානය ලෙස දැක්වෙනුයේ **ප්‍රපඤ්චකරණය** නම් වූ මානසික තත්ත්වයකි. එනම් මනස තුළ වැරදි වූ ආකල්පය මවාගැනීමයි. මෙය යෝගාචාර සම්ප්‍රදායේ එන විඥප්තිමාත්‍රතාවට සමාන වූ ඉගැන්වීමකි. මෙම අධ්‍යයනය තුළින් යෝගාචාර විඥප්තිමාත්‍රතා සංකල්පය යනු, ආදි බෞද්ධ දර්ශනයෙහිම සංවර්ධනයක් බව පෙන්වා දිය හැකිය.

ප්‍රමුඛ පදඃ *විඤ්ඤාණය, විඥප්තිමාත්‍රතාව, ප්‍රපඤ්චකරණය, මනස.*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍රපීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

karapikkadasobitha@gmail.com